දුරකථන / தொலைபேசி / Telephones: 011-2136600, 011-2136650
ලේකම් / செயலாளர் / Secretary: 011-2136602
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2876169, 011-2876181
විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E-mail: info@psc.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk

# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
## அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
## OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை
No. 1200/9, Rajamalwatta Road, Battaramulla

මගේ අංකය / எனது இல. / My No.: PSC/EST/05-03/02/2022
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2022.10.13

---

රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 03/2022

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

<u>විනය නියෝගයක් ක්‍රියාත්මක කිරීමේදී එම නියෝගය පනවනු ලබන දිනයත් වරද සිදුකළ දිනයත් යන දින දෙක අතර දිනයකදී ලබාදී ඇති උසස්වීමක් සම්බන්ධයෙන් ක්‍රියාකල යුතු ආකාරය පිළිබඳ උපදෙස්</u>

කිසියම් නිලධරයෙකුට යම් උසස්වීමක් ලබාදීමෙන් පසු, එම උසස්කිරීමේ දිනට පෙර සිදුකරනු ලැබූ වරදක් අනාවරණය වීම නිසා ඒ සම්බන්ධයෙන් නිකුත් කරන ලද චෝදනා පත්‍රයක් මත එම නිලධාරියාට විනය දඬුවමක් පනවා ඇති අවස්ථාවකදී, එම නිලධාරියාට වරද සිදුකරන ලද දිනයට පසුව ලබා දී ඇති ඉහත කී උසස්වීම සම්බන්ධයෙන් කටයුතු කිරීම පිළිබඳව ගැටළු ඇතිවී ඇති බව මෙම කොමිෂන් සභාව වෙත වාර්තා වී ඇත.

02. එබැවින් වරද සිදුකළ දිනයත් විනය නියෝගය පනවනු ලැබූ දිනයත් යන දින දෙක අතර දිනයකදී උසස්වීමක් ලබා ඇති යම් නිලධාරියෙකු, එම වරද මත ලබාදී ඇති විනය දඬුවම නිසා අදාළ උසස්වීම සඳහා නුසුදුස්සෙකු බවට පත්වී ඇත්නම්, එම විනය දඬුවම ක්‍රියාත්මක කිරීම සහ අදාළ උසස්වීම සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් ලබාගත යුතුය.

03. කෙසේ වුවද එලෙස ලබා දී ඇති උසස්වීම් බඳවා ගැනීමේ පටිපාටියේ හෝ සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි සාමාන්‍ය කාර්ය සාධනය අනුව නිර්බාධක පදනම මත ශ්‍රේණියෙන් ශ්‍රේණියට කරනු ලබන උසස්වීමක් නම්, එම විනය දඬුවම ක්‍රියාත්මක කිරීමෙන් පසුව අදාළ බඳවා ගැනීමේ පටිපාටියේ හෝ සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි නිලධාරියා සුදුසුකම් ලබන දිනය නැවත තීරණය කර එදින සිට ක්‍රියාත්මක වන පරිදි නිලධාරියාගේ උසස්වීම සංශෝධනය කිරීමට පත්වීම් බලධාරියා විසින් කටයුතු කළ යුත්තේය. ඒ සඳහා මෙම කොමිෂන් සභාවේ අනුමැතිය ඉල්ලා සිටීම අවශ්‍යය නොවන්නේය.

04. මෙම චක්‍රලේඛයේ සඳහන් කාර්යයන් සඳහා උසස්කිරීමක් යන්නෙන් නව තනතුරකට සිදුකරන ලද පත්වීමක් හෝ යම් තනතුරකට, ශ්‍රේණියකට හෝ නිලයකට කුමන ආකාරයකට හෝ සිදු කරනු ලැබූ උසස්වීමක් අදහස් වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

එම්.ඒ.බී. දයා සෙනරත්
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව